# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2008/30 - 2017 මාර්තු මස 03 වැනි සිකුරාදා - 2017.03.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 1/2012(II)

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ඍඇ) සහ (ෘඇ) වැනි වගන්ති යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද අමරවීර,
ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

2017 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2016 ශ්‍රී ලංකා ජල තීරය තුළ මසුන් සහ ජලජ සම්පත් ආරක්ෂා කිරීමේ නියෝග ලෙස හැඳින්වේ.

2. කාර්මික හෝ ගෘහ ආශ්‍රිත අපද්‍රව්‍ය ශ්‍රී ලංකා ජල තීරයට සෘජුව හෝ වක්‍රව බැහැර කිරීම කිසිදු තැනැත්තකු විසින් නොකළ යුතු ය.

3. ශ්‍රී ලංකා ජල තීරයේ මසුන් සහ ජලජ සම්පත්වලට හානි සිදුවන ආකාරයෙන් කිසිදු දූෂක ද්‍රව්‍යයක්, අපද්‍රව්‍යයක් හෝ බාහිර ද්‍රව්‍යයක් බැහැර කිරීම හෝ එම ජල තීරය ගොඩ කිරීම කිසිදු තැනැත්තකු විසින් නොකළ යුතු ය.

4. වෙරළ තීරයේ හෝ ශ්‍රී ලංකා ජල තීරයට යාබද කවර හෝ කොටසක හෝ වැඩෙන කඩොලාන පරිසර පද්ධතිය ඉවත් කිරීම, කැපීම හෝ යම් වෙනසක් සිදු කිරීම කිසිදු තැනැත්තකු විසින් නොකළ යුතු ය.

5. ශ්‍රී ලංකා ජල තීරයේ හෝ ඊට යාබද වෙරළ තීරයේ ජීවත්වන මත්ස්‍ය වර්ගවල සංරක්ෂණයට තර්ජනයක් වන කිසිදු ක්‍රියාකාරකමක් කිසිදු තැනැත්තකු විසින් නොකළ යුතු ය. එසේ වුව ද, කිසිදු අහිතකර බලපෑමක් ඇති නොවන යම් ක්‍රියාකාරකමක් සඳහා අනුගමනය කළ යුතු කොන්දේසි ඇතුළත් වන අවසර පත්‍රයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකිය.

6. මෙම නියෝගවල -

''ශ්‍රී ලංකා ජල තීරය'' යන්නට 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ ඊට ලබා දී ඇති අර්ථ නිරූපනයම අදහස් වේ.

''අපද්‍රව්‍ය'' යන්නෙන් ඝණ ද්‍රව්‍ය, ද්‍රාවන හෝ වායුමය ලෙස සෘජුව හෝ වක්‍රව නිදහස් කරන ද්‍රව්‍ය අදහස් වේ.

03 - 834

1A - PG 3430 — 2757 (2017/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*